## 01:1 හැඳින්වීම

මෙම පර්යේෂණ නිබන්ධනය ළමයා, ළමා සංවර්ධනය හා නර්තන චලන හඳුනා ගනිමින් ළමයාගේ මනෝකායික සංවර්ධනය කෙරෙහි නර්තනීය චලන මාධ්‍ය ඉවහල් වන ආකාරය විමසීමට උත්සාහ කරන්නකි.

අනාගත පූර්ණ පෞරුෂයකින් යෙබ් මිනිසෙක් (total man) බවට පත්වීමේ පදනම සකසා ගන්නා ලද වර්තමාන දරුවාට ඔහුගේ කායික මානසික චිත්තවේගීය අංගයන්ගේ සමතුලිත භාවය වර්ධනය කොට පවත්වාගෙන යාම අතිශය වැදගත් කර්තව්‍යයකි. ලෝකය ගොඩනැගී ඇත්තේ කලාව නිසා. කලාව යන්න මිනිසාගේ ජීවිතයේ උපතේ සිට මරණය තෙක් සල්ව ගෝ වලඳුව සෙවනැල්ලක් මෙන් සම්බන්ධ වී සිටී. මිනිසාගේ පුරාවෘත කවදා ඇති වීද, එදින සිට ප්‍රාථමික වශයෙන් පැවති කලාව සමග ප්‍රාථමික මිනිසා සම්බන්ධ විය.මිනිසාට සෞන්දර්යය විඳගෙන පහළ වීමට ප්‍රථම වූව අවිධිමත්ව ඔවුන් ජීවිතයට සම්බන්ධ කර ගත්තේ සෞන්දර්යාත්මක අංගයන්ය. එන් නර්තනය හා බැඳී නර්තන චලන මාධ්‍යයට ලැබෙනුයේ ප්‍රමුල ස්ථානයකි.

කලාවක් ලෙස ගොඩනැගුණු ලෝකයක වෙසෙන සත්වයා එම කලාවම සිය ජීවිතයේ දියුණුව කරා ළඟා කර ගැනීමේ මාධ්‍ය ලෙස සකස් කරගෙන ඇත. මිනිස් පරපුරේ ජීවය වන ළමා පරපුරෙහි සිත් තුළ සෞන්දර්ය රසයෙන් පුහු හැඟීම් ළපටි කාලයේ සිටම රෝපණය කළ යුතුය. එහෙයින් පිරිසිදු ළමා ලෝකයක් මෙන්ම මනා පෞරුෂයකින් යෙබ් අනාගත පුරවැසියන් වීමට නර්තන චලන තුලු කරන මෙහෙය පෙර්ම කාලීන වැදගත්කමකින් යුක්තය. දරුවකුට ලබාදෙන අධ්‍යාපන තත්ත්වය මත ඔහුගේ හෝ ඇයගේ චිත්ත වේගයන් ක්‍රියාකරන අන්දම සිදුම් ලෙස විශ්‍ර කළ යුතු බැවි විද්‍යාඥයන්ගේද උනන්දුවට බඳුන් වූ කරුණකි. ඔවුන්ගේ පර්යේෂණ මත ළමා මනසට උචිත පරිදි අධ්‍යාපන ක්‍රම සැකැස්මට අධ්‍යාපන විශාරදයෝ වෙහෙසුණහ. **එම ප්‍රතිඵලයක් ලෙස සවිඥාන ආශ්‍රයෙන් විනෝදයෙන් ඉගෙනීම ක්‍රම** ඇති කර ගත්හ. එහිදී එවන් විෂය පද්ධති හරහා දරුවාගේ සිත මෙන්ම කය ද එකතැන රැඳවීමට උත්සාහ ගෙන ඇත. එසේම ළමයාගේ ස්වභාවය හඳුනා ගනිමින් දරුවාට අධ්‍යාපනය ලබා දීමේදී පරිසරය ආශ්‍රය කොටගත් නර්තනය වැනි විෂයන් හරහා ස්මරණය, තොරයක් අත්දැකීම්, සංකල්ප මාතෘ, අධ්‍යාත්මික ප්‍රමෝධය වර්ධනය වීම සිදු වේ.

කම්මර පෞරුෂ සංවර්ධනයකින් යෙබ් පූර්ණ මිනිසෙකු බවට පත්වන කුඩා දරුවාගේ මානසික ශක්තිය වර්ධනය, අභියෝගාත්මක සිතුවිලි හා ස්ථාවර සිතුවිලි සිතට කැඳවීම නිරන්තරයෙන් සිදු විය යුතුය.මෙවැනි මානසික තත්ත්වයන් වර්ධනය කිරීමෙහිලා නර්තනය මගින් සපයන දායකත්වය කෙබඳු දැයි විමසීම මෙම නිබන්ධනයේ මූලික පරමාර්ථය වී ඇත.

දරුවාගේ මනෝ කායික සංවර්ධනය කෙරෙහි නර්තන චලන ඇති කරන බලපෑම නම් මෙම නිබන්ධනය හරහා දරුවා පිළිබඳවත්, ළමා සංවර්ධන අවධි හරහා දරුවාගේ වර්ධනයත් ඒ ආශ්‍රයෙන් දරුවාගේ සංවර්ධන තත්ත්වය කායික මානසික වශයෙන් විග්‍රහ කර ඇත. ශරීරයට අවශ්‍ය ආහාරපානාදිය ප්‍රමාණාත්මක ලෙස නොලැබීමෙන් ශරීරය දුර්වල වන්නාසේම මානසික අවශ්‍යතාවය සඳහා ප්‍රමාණාත්මක ආහාර නොලැබීමෙන් මනස දුර්වල වේ. ඒ හරහා චින්තනයටම දුර්වලතාම ඇතිවේ. අධික ලෙස ගැටුම් පවතී, මලානික හැඟීම ඇති වී, විපරීත චර්යාවන් හා මානසික රෝගීන් බිහිවෙයි. මෙවන් තත්ත්වයක් තුළ දරුවෙකුගේ ඉහත දුර්වලතා මග හැරීමට නර්තනය වැනි සුවිශේෂී කලාංගයක් හරහා සිදු කළ හැකි බව මෙම නිබන්ධනය හරහා තව දුරටත් විග්‍රහ කෙරේ. එසේම කොන්දේසිගත ප්‍රතිචාරය තුළින් දරුවෙකු තුළ ඇති වන බුද්ධි සංවර්ධනය මෙන්ම ආකල්ප සංවර්ධනයද මෙහිලා වැදගත්කොට සලකයි.

දරුවෙකුගේ ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීමේ අභිලාෂයෙන් ඇරඹි නර්තනය, නම් කලාවට, මූලාශ්‍ර වූ නර්තන චලනයන් අභිනවයෙන් නර්තන කලාවක් බිහිවීමේ පදනම හා නර්තනය නම් සුවිශේෂී කලාංගයේ පදනම අරුත විමසීම දෙවන පරිච්ඡේදයේදී සිදු කොට ඇති අතර එහි කාර්යභාරයද විමර්ශනය කොට ඇත. නර්තනය හා සම්බන්ධ න්‍යායන් භාවිතා කිරීමේදී හවර්ඩ් ගාඩනර්ගේ බහුවිධ බුද්ධි න්‍යාය පිළිබඳව මෙහි වැඩි දුරටත් විස්තර කිරීම තුළින් නර්තනය වැනි ප්‍රායෝගික විෂයක ගැබ් වී ඇති බුද්ධිමය ලක්ෂණ මතු කර ඇත.

මෙම නිබන්ධනයේ අභිමතාර්ථයන් වශයෙන් ළමා විය පිළිබඳ හඳුනාගැනීමත් චලන මාධ්‍යයක් වශයෙන් නර්තනයේ වැදගත්කම විමසීමත් එහි මනෝ විද්‍යාත්මක පසුබිම විමර්ශනය කර ඒ හරහා දරුවෙකුගේ සංවර්ධන කාර්යයට එය කෙසේ බලපවත්වන්නේදැයි සොයා බලයි.

දරුවාගේ මනෝකායික සංවර්ධනය කෙරෙහි නර්තනයේ චලනයන් ඇති කරන බලපෑම නම් පරීක්ෂණ ගැටළුව හරහා මවිසින් දරුවාගේ මනෝ කායික සංවර්ධනයට නර්තන චලන බලපෑමක් ඇති කරයි වශයෙන් උපකල්පනයක් ගොඩනගා ගනිමි. එබැවින් මාගේ අරමුණ වී ඇත්තේ දරුවාගේ මනෝ කායික සංවර්ධනයට නර්තන චලන බලපෑමක් ඇති කරනවාද යන්න විමසීමය.

මෙම පරීක්ෂණයේදී දත්ත සපයා ගැනීමට සම්මුඛ සාකච්ඡා ප්‍රධාන කොට සැලකූ අතර ප්‍රශ්නාවලිය අධ්‍යයන හතරක් සිදු කොට ඇත. එහිදී විවිධ වයස් මට්ටම් වලින් අහඹු ලෙස තෝරාගත් දරුවන් සිව් දෙනාගේ දෙමව්පියන්, ගුරුවරුන් සමග සාකච්ඡා කොට දත්ත තවදුරටත් තහවුරු කරගන්නා ලදී.

මෙම පරීක්ෂණය සිදු කිරීමට මා පොළඹවන ලද ප්‍රධාන හේතුව නර්තනය විෂයට පන්ති කාමරය තුළ ලැබෙන නොසැලකිලිමත්භාවයයි. එනිසා මෙම නිබන්ධනය කාලීන

වැදගත්කමකින් යුක්ත වනවාසේම එය තුළින් නර්තනය වැනි විෂයක සදාචාරාත්මක වටිනාකමටත් වඩා විද්‍යාත්මක වටිනාකම මනාව පැහැදිලි කරයි. නර්තනය තුළින් සදාචාරාත්මක හා ආකල්පමය අවබෝධය බොහෝ කෘති තුළින් විග්‍රහ කළද මෙවන් විෂයක පවතින මනෝ විද්‍යාත්මක පැතිකඩ පිළිබඳව විමර්ශණය කළ කෘති විරළය. එබැවින් මෙම නිබන්ධනය හරහා නර්තනය වැනි විෂය ක්ෂේත්‍රයක් පිළිබඳව වෙනස් දැක්මක් ඇති කරයි. මන්ද නර්තනය විෂය පාසල් විෂය මාලාව තුළ ද්විත්ව කාණ්ඩයේ විෂයක් ලෙස සලකන බොහෝ ගුරුවරුන් සිටිති. එසේම මෙහි ඇති ප්‍රායෝගික පැතිකඩ හේතුවෙන් හා සංඛ්‍යා, නියතීන් වැනි විද්‍යානුකූල ක්‍රමවේදයන් භාවිතා නොවීම සලකා බැලීමෙන් මෙම විෂය බුද්ධිමය විෂයක් නොවන බවට බොහෝ අයගේ මතය වී ඇති බැවින් නර්තනයේ ඇති විද්‍යාත්මක සේම බුද්ධිමය පාර්ශවය පසක් කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

## 01:2 පර්යේෂණ ගැටළුව :-

දරුවාගේ මනෝකායික සංවර්ධනය කෙරෙහි නර්තන චලන ඇති කරන බලපෑම කෙබඳුද ?

## 1.3 උපන්‍යාසය :-

"නර්තන චලන" දරුවාගේ මනෝකායික සංවර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කරයි.

## 1.4 අරමුණු :-

දරුවාගේ මනෝකායික සංවර්ධනයට නර්තන චලන බලපෑමක් ඇති කරනවාද යන්න විමසීම

## 1.5 අභිමතාර්ථ :-

- දරුවාගේ මනෝකායික සංවර්ධනය පිළිබඳ හඳුනාගැනීම
- චලන මාධ්‍යක් ලෙස නර්තනයේ ප්‍රභවය, කාර්ය භාරය විමසීමට ලක්කිරීම.
- නර්තනයට පසුබිම මනෝවිද්‍යාත්මක පැතිකඩ පිළිබඳව විමර්ශණය කිරීම.
- නර්තන චලනයන් හරහා ගොඩනැගෙන මානසික සංවර්ධනය හා කායික සංවර්ධනය පිළිබඳ විමසීම.

## 1.6 අධ්‍යයන සීමා :-

- **විෂය සීමා** :- දරුවාගේ මනෝ කායික සංවර්ධනය කෙරෙහි නර්තන චලන ඇතිකරන බලපෑම නම් මෙම නිබන්ධනයේ අන්තර්ගත විශ්ලේෂණය සඳහා අහඹු ලෙස දරුවන් සිව් දෙනෙකු තෝරා ගන්නා ලදී. එහිදී විවිධ වයස් මට්ටම් වලින් යුත් දරුවන් සිව් දෙනෙකු, එනම් වයස අවු : 1 - 2 ත් අතර, 17 - 18 ත් අතර, 18 - 20 අතර, 25 ට වැඩි වශයෙන් යුත් දරුවන් තෝරා ගත්තෙමි.